# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2044/38 – 2017 නොවැම්බර් 09 වැනි බ්‍රහස්පතින්දා – 2017.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2017/26.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. මධුරවීරන් මයා, අංක 65, ජන උදාන ගම්මානය, බටුගම්පොල, හඳපාන්ගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා බැංකුව, ප්‍රධාන කාර්යාලය, අංක 01. ලංකා බැංකු මාවත, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1, පී. නවරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

1A – G 26566 – 12 (2017/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2017/26.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. මධුරවීරන් මයා, අංක 65, ජන උදාන ගම්මානය, බටුගම්පොල, හඳපාන්ගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා බැංකුව, ප්‍රධාන කාර්යාලය, අංක 01. ලංකා බැංකු මාවත, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''1981.08.27 දින සිට ලංකා බැංකුවේ සේවය කරන ලද එස්. මධුරවීරන් මහතා ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගෙන ඇත්තේ 2001.10.03 වන දින වන අතර නිසි වයස සම්පූර්ණ වීම මත 2004.12.04 දින විශ්‍රාම ගන්වනු ලැබීමෙන් නියමිත ස්ථිර සේවා කාලය සම්පූර්ණ නොකිරීම යන හේතුව මත විශ්‍රාම වැටුප් හිමිකම අහිමි කිරීම යුක්ති සහගතද යන්න හා යුක්ති සහගත නොවේ නම් ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ,''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

11 – 1062

---

මගේ අංකය: IR/COM/03/2016/78.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

වයි. ආර්. කමනි හසන්ති මිය, කුරුඳුවත්ත, හිදැල්ලන, රත්නපුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක. 77, ටී. පියසෝම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2016/78.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

වයි. ආර්. කමනි හසන්ති මිය, කුරුඳුවත්ත, හිදැල්ලන, රත්නපුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ඉල්ලුම්කාර වයි. ආර්. කමනි හසන්ති නමැත්තියට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් 2015.07.06 දින ලිපිකරු පත්වීමක් ලබා දී, එම පත්වීම 2015 මහමැතිවරණය ප්‍රකාශයට පත් කිරීම හේතුකොට ගෙන මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කළ චක්‍රලේඛයන්ට අනුව, 2015.07.14 පත්වීම අවලංගු කොට ඇගේ රැකියාව අහිමිකොට ඇත. නමුත් ඒ හා සමානවම පත්වීම් ලබාදුන් රියදුරු, කොන්දොස්තර කාණ්ඩයන්හි පත්වීම් ස්ථිර කොට ඇත. ඒ අනුව මෙම ඉල්ලුම්කාරියට තම රැකියාව අහිමි කිරීම සම්බන්ධව අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එසේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

11 – 1063

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.